# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1804/51 – 2013 අප්‍රේල් 05 වැනි සිකුරාදා – 2013.04.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම් ලබාගැනීමට රජය අදහස් කරන බැවි, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩම්වල විස්තර:

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, දාසියපත්තුව සුළු කොට්ඨාසයේ, මීනුවන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පිහිටි අංක 126/2, බුරුල්ලපිටිය ග්‍රාම නිලධාරි වසමෙහි බුරුල්ලපිටිය ගමෙහි ගම්පහ ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරිගේ අංක ගම්. 3895 හා 2013.02.20 දිනැති මූලික පිඹුරේ කැබලි අංක 01 සහ 02 වශයෙන් දක්වා ඇති ඉඩම් කැබලි.

**කැබලි අංක 01**
ඉඩමේ නම: මූණමල්ගහකුඹුර; විස්තරය: විවෘත මුඩුබිම; හිමිකම් කියන අය: ආර්. ඩබ්ලිව්. එච්. රාජපක්ෂ මයා, ආඩියාගාර, නිල්පනාගොඩ; ප්‍රමාණය: හෙක්. 0.0384.

**කැබලි අංක 02**
ඉඩමේ නම: මූණමල්ගහකුඹුර; විස්තරය: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිලි 01ක් සහ තාවකාලික ගොඩනැගිලි 01ක් ඇත; හිමිකම් කියන අය: ආර්. ඩබ්ලිව්. එච්. රාජපක්ෂ මයා, ආඩියාගාර, නිල්පනාගොඩ; ප්‍රමාණය: හෙක්. 0.0121.

ඉහත සඳහන් ඉඩම්වලට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 2013 මැයි මස 08 වැනි දින පූ. හා. 10.00 ට මීනුවන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය.

තවද, 2013 අප්‍රේල් මස 24 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම් ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

සී. පී. ඩබ්ලිව්. ගුණතිලක,
ප්‍රාදේශීය ලේකම් (වැ.බ.),
මීනුවන්ගොඩ.

2013 අප්‍රේල් මස 04 වැනි දින,
මීනුවන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

04 – 647

---

සංශෝධනයයි

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

මගේ අංකය: බිය3/1/1/231.

වර්ෂ 2006 සැප්තැම්බර් මස 21 වැනි දින අංක 1463/24 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද දැන්වීමේ සඳහන් මු.පි. ගම්. 3361 දරන පිඹුරේ කැබලි අංක 02 කැබලි අංක 40, 41 වශයෙන් සංශෝධනය විය යුතු බව මෙයින් දැනුම් දෙමි.


1A – G 17524 – 395 (2013/04)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**කැබලි අංක 40**

ඉඩමේ නම: කොස්ගහවත්ත, වරි. අංක 169, මාවරමණ්ඩිය පාර; විස්තරය: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිල්ලක කොටසක් ඇත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: ඩබ්ලිව්. ඩී. එෆ්. එම්. රියන්සි, අංක 169, මාවරමණ්ඩිය පාර, මාකොළ; ප්‍රමාණය: හෙක්. 0.0170.

**කැබලි අංක 41**

ඉඩමේ නම: කොස්ගහවත්ත හෙවත් මිල්ලගහවත්ත; විස්තරය: ගෙවත්ත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: කේ. ඒ. පී. දයාරත්න, අරලිය වත්ත, මාකොළ දකුණ; ප්‍රමාණය: හෙක්. 0.0034.

ඉහත සඳහන් ඉඩම්වලට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 2013 මැයි මස 20 වැනි දින පූ. භා. 10.00 ට බියගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය.

තවද, 2013 මැයි මස 06 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් පිඹුරු අංකය සහ කැබලි අංකය සඳහන් කරමින් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම් ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

චම්පිකා ඩී. ධර්මසේන,
සහකාර ප්‍රාදේශීය ලේකම්,
බියගම.

2013 මාර්තු මස 27 වැනි දින,
බියගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

04 – 646/1

---

## සංශෝධනයයි

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

මගේ අංකය: බිය3/1/1/231.

වර්ෂ 2006 පෙබරවාරි මස 09 වැනි දින අංක 1431/27 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද දැන්වීමේ සඳහන් මු.පි. ගම්. 3429 දරන පිඹුරේ කැබලි අංක 45 කැබලි අංක 96. 97 වශයෙන් සංශෝධනය විය යුතු බව මෙයින් දැනුම් දෙමි.

**කැබලි අංක 96**

ඉඩමේ නම: මිල්ලගහවත්ත; විස්තරය: ගෙවත්ත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: පී. ආර්. ඒ. එස්. ගුණතිලක, අංක 486, මාකොළ උතුර, මාකොළ; ප්‍රමාණය: හෙක්. 0.0037.

**කැබලි අංක 97**

ඉඩමේ නම: මිල්ලගහවත්ත; විස්තරය: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිල්ලක කොටසක් ඇත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: පී. ඒ. පී. ගුණතිලක, අංක 486, මාකොළ උතුර, මාකොළ; ප්‍රමාණය: හෙක්. 0.0101.

ඉහත සඳහන් ඉඩම්වලට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 2013 මැයි මස 20 වැනි දින පූ. භා. 10.00 ට බියගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය.

තවද, 2013 මැයි මස 06 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් පිඹුරු අංකය සහ කැබලි අංකය සඳහන් කරමින් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම් ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

චම්පිකා ඩී. ධර්මසේන,
සහකාර ප්‍රාදේශීය ලේකම්,
බියගම.

2013 මාර්තු මස 27 වැනි දින,
බියගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

04 – 646/2

---

## ශුද්ධි පත්‍රිකාව

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

මගේ අංකය: DS/UP/3/1/LAQ/EGO.TANK/37.
ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය: LD/05/2009/WS/292.

උක්ත ශීර්ෂය යටතේ 2013.01.04 වැනි දින අංක 1791/39 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* අංක 01 - 543 යටතේ මවිසින් පළ කරන ලද දැන්වීමෙහි සඳහන් දිනයන් ඉවත් කොට ඒ වෙනුවට වෙනත් දිනයන් ආදේශ කිරීමෙන් එම දැන්වීම පහත සඳහන් පරිදි සංශෝධනය කරනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

| *ඉවත් කළ යුතු දිනයන්* | *ඉවත් කළ යුතු දිනයන් වෙනුවට ආදේශ කළ යුතු දිනයන්* |
|---|---|
| 2013 පෙබරවාරි මස 13 | 2013 ජුනි මස 24 |
| 2013 පෙබරවාරි මස 06 | 2013 ජුනි මස 17 |

බී. එම්. නිමල් බාලසූරිය,
ප්‍රාදේශීය ලේකම්,
උඩපලාත - ගම්පොල.

2013 අප්‍රේල් මස 03 වැනි දින,
උඩපලාත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

04 – 648

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.